5219

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# தென் மாகாணக் கல்வித் திணைக்களம்
# Southern Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) 12 ශ්‍රේණිය තෙවන වාර පරීක්ෂණය, 2018 ජූලි
கல்விப் பொதுத் தராதர (உயர்தரப்) பரீட்சை 2018 ஜூலை, தரம் 12 மூன்றாம் தவணைப் பரீட்சை
**General Certificate of Education (Adv. Level), Grade 12 Third Term Test, 2018 July**

භූගෝල විද්‍යාව - I
**Geography - I**

**22 S I**


පැය දෙකයි
**02 hours**

**I කොටස**

උපදෙස්:
- මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්තය.
- පළමු කොටස බහුවරණ ප්‍රශ්න 30ක් හා සිතියම් විවරණය සඳහා අදාළ මෙට්‍රික් සිතියම් කොටස ද සපයා ඇත.
- පළමු කොටස අනිවාර්ය වන බව සලකන්න.
- දෙවන කොටස භෞතික හා මානුෂ වශයෙන් කොටස් දෙකකට වෙන් කොට ඇති අතර එක් කොටසකින් එක් ප්‍රශ්නයක්වත් තෝරාගෙන ප්‍රශ්න තුනකට පිළිතුරු සැපයිය යුතුයි.

- **ප්‍රශ්න අංක 1 සිට 30 දක්වා දී ඇති ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියන්න.**

01. පහත රූප සටහනෙහි දක්වෙන්නේ පෘථිවි අභ්‍යන්තරයේ හරස්කඩකි. එහි ශිලාගෝලයට පමණක් අයත්වන ස්ථර ඇතුළත් නිවැරදි පිළිතුර වන්නේ,




1. AB  2. AD  3. AE  4. BD
5. CE (...........)

02. භෞතික භූගෝල විද්‍යාව සමෝධානිත විෂයය ක්ෂේත්‍රයක් ලෙස සලකනු ලබන්නේ
1. භෞතික භූගෝල විද්‍යා විෂයය භූ රූප පිළිබඳව පමණක් හදාරණ විෂයය ක්ෂේත්‍රයක් වන බැවිනි
2. භෞතික භූගෝල විද්‍යා විෂයය උප විෂයයන් රාශියක් එකතු වී නිර්මාණය වී ඇති විෂයය ක්ෂේත්‍රයක් වන බැවිනි
3. භෞතික භූගෝල විද්‍යා විෂයය පෘථිවිය මතුපිට පිහිටි විවිධ පද්ධතීන් හදාරණ විෂයය ක්ෂේත්‍රයක් බැවිනි
4. භෞතික භූගෝල විද්‍යා විෂයය පෘථිවි අභ්‍යන්තරය පිළිබඳව හදාරණ විෂයය ක්ෂේත්‍රයක් බැවිනි
5. භෞතික භූගෝල විද්‍යා විෂයය එක් විෂයය ක්ෂේත්‍රයකට පමණක් සීමා වූ විෂයය ක්ෂේත්‍රයක් වන බැවිනි (...........)

03. මෙම වායු ස්ථරයේ ඉහළ සීමාව කි. මී. 80ක් පමණ ඉහළට විහිදේ. ඉහළට යත්ම උෂ්ණත්වය ශීඝ්‍රයෙන් අඩුවේ. වායුගෝලයේ උෂ්ණත්වය අඩුම ස්ථරය මෙය ලෙස හැඳින්වේ. ඉහත තොරතුරුවලින් හැඳින්වෙන වායුගෝලීය ස්ථරය වනුයේ,
1. පරිවර්තී ගෝලය  2. අපරිවර්තී ගෝලය  3. මෙසෝ ගෝලය  4. අයන ගෝලය
5. බාහිර ගෝලය (...........)


04. ආග්නේය හා අවසාධිත පාෂාණවලට උදාහරණ පිළිවෙළින් දක්වා ඇති පිළිතුර වන්නේ,
1. ජිප්සම්, පෙරිඩොටයිට්  2. ග්‍රැනයිට්, ක්වාට්සයිට්  3. ඩොලමයිට්, ගල් අඟුරු  4. මඩ, ශල්ක
5. බැසෝල්ට්, වැලිගල් (...........)

05. ආවෘත හා විවෘත පද්ධති සඳහා උදාහරණ පිළිවෙළින් සපයා ඇති පිළිතුර වන්නේ,
1. පෘථිවි පද්ධතිය හා විශ්වය
2. ගංගා ද්‍රෝණි හා ග්ලැසියර් ප්‍රදේශ
3. පෘථිවි පද්ධතිය හා තුන්ද්‍රා ප්‍රදේශ
4. තෙත් බිම් හා තෘණ බිම්
5. සෞරග්‍රහ මණ්ඩලය හා පෘථිවි පද්ධතිය (...........)

06. වියළි කලාපයට පමණක් සීමා වූ පාංශු වර්ග පමණක් නිවැරදිව දක්වා ඇති පිළිතුර වන්නේ,
1. රතු දුඹුරු පස හා ක්ෂාරීය නොවන දුඹුරු පස
2. රතු දුඹුරු ලැටසොල් පස සහ රතු කහ පොඩ්සොලික් පස
3. ගොහොරු හා අර්ධ ගොහොරු පස සහ ක්ෂාරීය සහ ලවණ පස
4. රතු දුඹුරු ලැටසොල් පස සහ ග්‍රැමුසොල් පස
5. රතු කහ පොඩ්සොලික් පස සහ ක්ෂාරීය නොවන දුඹුරු පස (...........)

07. සාගරික තැටියක් ප්‍රාවරණය තෙක් ම තල්ලු වී ගොස් පාෂාණ තැටිය උණු වී ද්‍රව බවට පත් වී ගලා ඒමෙන් නිර්මාණය වන භූ රූපය වන්නේ,
1. නැමි කඳු
2. අගාධ
3. විභේද
4. දූපත් චාප
5. භූමි කම්පා (...........)

08. පහත P, Q, හා R ලෙස දක්වා ඇති භූ රූප නිවැරදිව දක්වා ඇති පිළිතුර වන්නේ,



P Q R


1. P - සමමිතික නැම්ම Q - පාකොලිත R - ආස්තරය
2. P - අසමමිතික නැම්ම Q - හෝර්ස්ට් R - ලැකොලිත
3. P - උලැඟි නැම්ම Q - සෝපානාකාර විභේදය R - ආස්තරය
4. P - සුවිභේදය Q - බැතොලිත R - උඩුකුරු විභේදය
5. P - දූපත් චාප Q - අගාධ R - ලොපොලිත (...........)

09. ලොව භූමි කම්පාවල 70%කටත් වඩා වැඩි අපිකේන්ද්‍ර පිහිටා ඇත්තේ
1. අත්ලන්තික් සාගරයේය
2. පැසිෆික් සාගරයේය
3. ඉන්දියන් සාගරයේය
4. ආර්ක්ටික් සාගරයේය
5. ඇන්ටාර්ටික් සාගරයේය (...........)

10. ක්වටාරා අවපාතය සහරා කාන්තාරයේ දකිය හැකි භූ රූපයකි. එය නිර්මාණය වීම කෙරෙහි බලපා ඇති ප්‍රධාන ඛාදන ක්‍රියාවලිය වන්නේ,
1. අපහරණය
2. සිරස් සංඝර්ෂණය
3. උල්ලේඛය
4. තිරස් සංඝර්ෂණය
5. උත්පාටනය (...........)

11. ගංගාවක ඛාදිත භූ රූප දෙකක් පමණක් නිවැරදිව දක්වා ඇති පිළිතුර වන්නේ,
1. ගල් වන හා දොරු
2. වාඩි හා සලපිල
3. ගං මළු හා හැඩපලු ගංගා
4. දුනුවිල් හා නෙත්ති නෙරු
5. ගං කණ්ඩි හා පිටාර තැන්න (...........)

12. පහත භූ රූප අතුරින් කාන්තාර ප්‍රදේශවල ජලය මගින් නිර්මාණය කරන භූ රූප පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,





A B C D

1. AB
2. BC
3. AC
4. BD
5. AD (...........)

13. පෘථිවියේ අවකාශීය විවිධත්වය අධ්‍යයනය කිරීම භූගෝල විද්‍යාව ලෙස අර්ථ කථනය කරනු ලැබුවේ,
1. රිචර්ඩ් හාට්ශෝන් 2. රැට්සෙල් 3. සෙම්පල්
4. ඇලෙක්සැන්ඩර් වොන් හම්බෝල්ඩ්ට් 5. හංටිංටන් (...........)

14. 2017 වන විට වාර්තා වූ ලෝක ජන සංඛ්‍යාව
1. බිලියන 8 2. බිලියන 9.2 3. බිලියන 7.5 4. බිලියන 6.4
5. බිලියන 11.4 (...........)

15. පහත ලෝක සිතියමේ අංක 1, 2 හා 3 ලෙස දක්වා ඇති ගෝලීය ජන ව්‍යාප්ති කලාප නිවැරදිව දක්වා ඇති පිළිතුර වන්නේ,




1. 1 - ජන හීන 2 - ජනාධික 2. 4 - ජනාධික 2 - ජන හීන 3. 3 - මධ්‍යස්ථ 2 - ජනාධික
4. 1 - ජනාධික 3 - මධ්‍යස්ථ 5. 2 - ජනාධික 3 - මධ්‍යස්ථ (...........)

16. පහත දක්වා ඇත්තේ ලෝකයේ රටවල් දෙකක දළ උපත් අනුපාතිකයන්ය.
A. 8.07 B.46.2
මෙම උපත් අනුපාතික සඳහා නිවැරදි උදාහරණ පිළිවෙළින් දී ඇති පිළිතුර වන්නේ,
1. A - ජපානය B - නයිජර් 2. A - ස්වීඩනය B - ස්විට්සර්ලන්තය
3. A - කෙන්යාව B - ඉතාලිය 4. A - නෙදර්ලන්තය B - ඉන්දියාව
5. A - මැලේසියාව B - මියන්මාරය (...........)

17. ජන සංඛ්‍යා පිරමීඩයක ස්වභාවය තීරණය කරනු ලබන්නේ,
1 උපත් සීඝ්‍රතාවය අනුවය 2. මරණ සීඝ්‍රතාවය අනුවය 3. සාඵල්‍යතාවය අනුවය
4. සංක්‍රමණ අනුවය 5. උපත් හා මරණ සීඝ්‍රතාවය අනුවය (...........)

18. කිසියම් ප්‍රදේශයකින් ජනයා තල්ලු කිරීමට හේතු වන සාධකයක් විය හැක්කේ,
1. ප්‍රශස්ත දේශගුණය 2. දියුණු යටිතල පහසුකම් 3. වේගවත් ප්‍රාදේශීය සංවර්ධනය
4. දේශපාලන අස්ථායිතාව 5. සන්නිවේදන සේවාවන්වල ව්‍යාප්තිය (...........)

19. ශ්‍රී ලංකාවේ වැඩිම වාර්ෂික ජන සංඛ්‍යා වර්ධන වේගයක් වාර්තා කරන දිස්ත්‍රික්කය ලෙස සැලකෙන්නේ
1. පුත්තලම 2. අම්පාර 3. අනුරාධපුරය 4. බදුල්ල
5. පොළොන්නරුව (...........)


20. වර්ෂ 2012 වන විට ශ්‍රී ලංකාවේ වයස්ගත ජන සංඛ්‍යා ප්‍රතිශතය
1. 12.4% 2. 8.3% 3. 6.8% 4. 9.7%
5. 18.4% (...........)

21. ජනාවාස වර්ධන ධුරාවලියේ මූලික ම අවස්ථාව ලෙස සැලකෙන්නේ
1. කුඩාගම 2. නගරය 3. ගොවිපළ 4. කුඩා නගරය
5. මහනගරය (...........)

22. 1:50000 සිතියම්වල දක්නට ලැබෙන සංස්කෘතික ලක්ෂණ පමණක් ඇතුළත් පිළිතුර වන්නේ
1. අප්‍රධාන මාර්ගය, හින්දු කෝවිල 2. වී වගාව, අවතල බෑවුම
3. දිය බෙත්ම, ශාඛීය ජලවහන රටාව 4. පාසල, තීර්යක් නිම්නය
5. සමෝච්ඡ රේඛා, අතු ගංගා (...........)

23. භූ ලක්ෂණ සිතියම් සකස් කිරීමේ දී වර්තමානයේ යොදා ගන්නා වඩාත්ම කාර්යක්ෂම මූලාශ්‍රය වනුයේ
1. අඟලේ සිතියම් 2. බිම් මැනුම් 3. චන්ද්‍රිකා තාක්ෂණය 4. ගෝලීය බණ්ඩාංක
5. ජාතික බණ්ඩාංක (...........)

24. පහත දී ඇති විස්තරයට වඩාත් ගැළපෙන භූ ලක්ෂණය හෝ භූ ලක්ෂණ ඇතුළත් පිළිතුර වන්නේ
කඳු මුදුනේ දී සමෝච්ඡ රේඛා එකිනෙකට ළංව ද කඳු පාමුල දී සමෝච්ඡ රේඛා එකිනෙකට ඈත්ව ද පිහිටා ඇති විට



P Q R S

1. P හා Q 2. P පමණි 3. Q හා R 4. R පමණි
5. S පමණි (...........)

25. මෙට්‍රික් සිතියමක සිතියම් මුහුණතෙහි හඳුනාගත හැකි ලක්ෂණයක් වන්නේ,
1. පත්‍ර නාමය 2. පරිමාණය 3. යාබද සිතියම් 4. ජාතික බණ්ඩාංක
5. අක්ෂාංශ හා දේශාංශ ඡේදනය වන ලක්ෂ්‍ය (...........)


26. දෛශික දත්ත ආකෘතිය යටතේ මාර්ග, වගාබිම්, ගොඩනැගිල්ලක් දක්වීම සඳහා යොදා ගන්නා සංකේත පිළිවෙළින් දක්වා ඇති පිළිතුර වන්නේ,
1. රේඛා, බහු අස්‍ර, ලක්ෂ්‍ය 2. බහු අස්‍ර, ලක්ෂ්‍ය, රේඛා 3. රේඛා, ලක්ෂ්‍ය, බහු අස්‍ර
4. බහු අස්‍ර, රේඛා, ලක්ෂ්‍ය 5. ලක්ෂ්‍ය, බහු අස්‍ර, රේඛා (...........)

27. ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතියෙහි ප්‍රධාන මෙහෙයුම් මධ්‍යස්ථාන පිහිටියේ
1. ඇ. එ. ජ 2. රුසියාව 3. ප්‍රංශය 4. ආර්ජන්ටිනාව
5. අත්ලාන්තික් සාගරය (...........)

28. සූර්ය ශක්තිය උපයෝගී කර ගනිමින් පෘථිවියෙහි වස්තූන් හඳුනා ගැනීමේ ක්‍රමවේදය
1. දුරස්ථ සංවේද වේදිකා 2. දුරේක්ෂ 3. අක්‍රිය දුරස්ථ සංවේදය
4. ක්‍රියාකාරී දුරස්ථ සංවේදය 5. තියඩොලයිට් (...........)

29. පෘථිවියට ඉහළින් කක්ෂගත කර ඇති චන්ද්‍රිකා පද්ධතියක් මගින් පෘථිවියේ ඕනෑම ස්ථානයක හෝ වස්තුවක පිහිටීම ඉතාම නිවැරදිව ප්‍රකාශ කළ හැකි ක්‍රමවේදය වන්නේ,
1. දුරස්ථ සංවේද තාක්ෂණය 2. භූගෝලීය තොරතුරු පද්ධතිය
3. ඇල ගුවන් ඡායාරූප 4. ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතිය
5. සිවරැස් දත්ත ආකෘතිය (...........)

30. යාබද රූප සටහනෙහි දක්වෙන සිතියම් විද්‍යාත්මක ක්‍රම ශිල්පයෙහි සුවිශේෂී ලක්ෂණයක් වන්නේ,



1. සිතියමක ඇති විවිධ තොරතුරු වෙන් වෙන් වශයෙන් පරිශීලනය කිරීමේ හැකියාව
2. තොරතුරු ඉදිරිපත් කිරීම සීමාකාරීවීම
3. සංකීර්ණ බණ්ඩාංක ක්‍රමවේදයක් භාවිතය
4. දත්ත යාවත්කාලීන කිරීම අපහසුවීම
5. අවකාශීය නොවන දත්ත විශ්ලේෂණය කළ නොහැකි වීම (...........)

5226

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# தென் மாகாணக் கல்வித் திணைக்களம்
# Southern Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) 12 ශ්‍රේණිය තෙවන වාර පරීක්ෂණය, 2018 ජූලි
கல்விப் பொதுத் தராதர (உயர்தரப்) பரீட்சை 2018 ஜூலை, தரம் 12 மூன்றாம் தவணைப் பரீட்சை
**General Certificate of Education (Adv. Level), Grade 12 Third Term Test, 2018 July**

භූගෝල විද්‍යාව - I
**Geography - I**

22 S I




1:50,000

සමෝච්ච රේඛා අන්තරය **20m** කි.

5218

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# தென் மாகாணக் கல்வித் திணைக்களம்
# Southern Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) 12 ශ්‍රේණිය තෙවන වාර පරීක්ෂණය, 2018 ජූලි
கல்விப் பொதுத் தராதர (உயர்தரப்) பரீட்சை 2018 ஜூலை, தரம் 12 மூன்றாம் தவணைப் பரீட்சை
**General Certificate of Education (Adv. Level), Grade 12 Third Term Test, 2018 July**

භූගෝල විද්‍යාව II
**Geography II**

22 S II


පැය තුනයි
**03 hours**

**එක් කොටසකින් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

## I කොටස

### භෞතික භූගෝල විද්‍යාව

1. (i) පහත රූප සටහනේ A ලෙස නම් කර ඇති පද්ධතියෙහි හඳුනා ගත හැකි උප පද්ධතීන් දෙකක් නම් කරන්න.




(ලකුණු 02)

(ii) විවෘත පද්ධතියක් ලෙස වෙරළ පරිසර පද්ධතියක ක්‍රියාකාරිත්වය පහත ශීර්ෂ යටතේ විස්තර කරන්න.
1. ආදාන 2. ප්‍රතිදාන 3. ක්‍රියාවලි (ලකුණු 06)

(iii) වායුගෝලීය උෂ්ණත්වයේ සිරස් ව්‍යාප්තිය දළ රූප සටහනක් ආධාර කර ගනිමින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iv) භෞම පද්ධතියේ තුළිතතාව ආරක්ෂා කර ගැනීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග තුනක් සාකච්ඡ කරන්න. (ලකුණු 06)

02. (i) ආක්‍රාන්ත ආග්නේය පාෂාණ හා නිෂ්ක්‍රාන්ත ආග්නේය පාෂාණ අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 02)


(ii) අවසාධිත පාෂාණ නිර්මාණය වන ආකාරය උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 06)


(iii) පාංශු පැතිකඩක් ඇඳ නිවැරදිව නම් කරන්න. ඉන් එක් මහලක් පිළිබඳව කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

(iv) ශ්‍රී ලංකාවේ උස් බිම් පාෂාණ ශ්‍රේණියේ විශේෂ ලක්ෂණ දළ සිතියමක් ආධාර කර ගනිමින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

03. (i) තැටි චලනය වීම හේතු කොට ගෙන ඇතිවන බලපෑම් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) පහත A, B ලෙස නම් කර ඇති තැටි චලනය වන ආකාර නිවැරදිව නම් කර ඒවායේ ක්‍රියාකාරිත්වය උදහරණ සහිතව විස්තර කරන්න.



A



B

(ලකුණු 06)

(iii) ආනතීය චලන යනු කුමක්දැයි හඳුන්වා ඒ හේතු කොට ගෙන නිර්මාණය වන භූ රූප දෙකක් රූප සටහන් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 06)


(iv) නිෂ්ක්‍රාන්ත යමකම යන්න හඳුන්වන්න. පහත දී ඇති නිෂ්ක්‍රාන්ත යමහල් භූ රූප පිළිවෙළින් නිවැරදිව නම් කරන්න. ඔබ නම් කළ භූ රූප නිර්මාණය වන ආකාරය පැහැදිලි කරන්න.


P


Q

(ලකුණු 06)

04. (i) බහිර්ජන්‍ය බලවේග දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)




(ii) ඉහත A සහ B ලෙස නම් කර ඇති ගංගා දික් පැතිකඩෙහි අවස්ථා දෙකක් නම් කර ඒවායෙහි සුවිශේෂී ලක්ෂණ වෙන් වෙන්ව විස්තර කරන්න. (ලකුණු 06)

(iii) ගංගා ඛාදනය සිදුවන ආකාර තුන කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iv) පහත දක්වා ඇති ගංගා ක්‍රියාවලිය හේතු කොට ගෙන නිර්මාණය වන භූ රූප වෘද්ධ හා පරිණත අවස්ථා අනුව වර්ග කරන්න.


1. ගල්වන 2. දොරු 3. දූනු විල් 4. හැඩපලු ගංගා (ලකුණු 06)

ඔබ ඉහත වර්ග කළ එක් අවස්ථාවකින් එක් භූ රූපය බැගින් ගෙන දළ රූප සටහන් ආධාර කර ගනිමින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

## II කොටස

### මානුෂ භූගෝල විද්‍යාව

05. (i) පහත දී ප්‍රස්තාර සටහනෙහි දැක්වෙන්නේ ලෝකයේ එක්තරා රටක ළදරු මරණ අනුපාතිකයයි.




එක්සත් ජාතීන්ගේ ජන සංගණන වාර්තා 2015

1. ඉහත ප්‍රස්තාර සටහනේ දක්වා ඇති ළදරු මරණ අනුපාතිකයේ හඳුනාගත හැකි ප්‍රවණතාවය කවරක් ද?
2. ඔබ ඉහත සඳහන් කළ ප්‍රවණතාවයට අනුව එම රටෙහි සමාජයීය සංවර්ධනය පිළිබඳව කවරක් ප්‍රකාශ කළ හැකි ද? (ලකුණු 02)

(ii) ලෝක ජන සංඛ්‍යාව අසම ලෙස ව්‍යාප්ත වීම කෙරෙහි බලපාන භෞතික සාධක දෙකක් සහ මානව සාධක එකක් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) ශ්‍රී ලංකාවේ ජනයා අවතැන්වීම කෙරෙහි බලපාන හේතු තුනක් සාකච්ඡා කරන්න. (ලකුණු 06)

(iv) ශ්‍රී ලංකාවේ ශුද්ධ සංක්‍රමණ සෘණ අගයක් ගැනීම කෙරෙහි හේතු තුනක් සාකච්ඡා කරන්න. (ලකුණු 06)

06. (i) දළ උපත් අනුපාතිකය හා දළ මරණ අනුපාතිකය ගණනය කරන ආකාරය ලියා දක්වන්න. (ලකුණු 02)

(ii) ඉහත එක් එක් අනුපාතිකවල ඇතිවන ඉහළ යෑම හේතු කොට ගෙන රටක ඇතිවිය හැකි ජනවිද්‍යාත්මක ගැටලු දෙක බැගින් වෙන වෙනම සඳහන් කරන්න. ඉහත එක් එක් අනුපාතිකවල ඇතිවන පහළ යෑම හේතුකොටගෙන ඇතිවිය හැකි ජනවිද්‍යාත්මක ගැටලු එක බැගින් කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 06)

(iii) ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවේ ශ්‍රම බලකාය සංකෝචනය වීම කෙරෙහි බලපාන හේතු දෙකක් විස්තර කරන්න. (ලකුණු 06)

(iv) ශ්‍රී ලංකාවේ බාහිර සංක්‍රමණ විශාල ලෙස සිදුවීම හේතුකොටගෙන ඇතිවිය හැකි ධනාත්මක ප්‍රතිඵල දෙකක් සහ සෘණාත්මක ප්‍රතිඵල එකක් විස්තර කරන්න. (ලකුණු 06)

07. (i) ජනාවාසයක දක්නට ලැබෙන මූලිකාංග දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)


(ii) ගැමිරික ජනාවාසයක හඳුනාගත හැකි සුවිශේෂී ලක්ෂණ සාකච්ඡා කරන්න. (ලකුණු 06)

(iii) පහත දී ඇති ජනාවාස රටා රූප සටහන් ආධාර කර ගනිමින් පැහැදිලි කරන්න.

1. රේඛිය ජනාවාස 2. පොකුරු ජනාවාස (සැලසුම්ගත ජනාවාස) (ලකුණු 06)

(iv) ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රදේශවල ජනාවාස සැලසුම් කිරීමේ දී සලකා බැලිය යුතු ක්ෂේත්‍ර තුනක් සාකච්ඡා කරන්න. (ලකුණු 06)

08. (i) පහත ලෝක සිතියමෙහි R, S සහ T ලෙස දක්වා ඇත්තේ ලෝකයේ අධික නාගරික ශීඝ්‍රතාවක් පෙන්නුම් කරන කලාප තුනකි. ලොව නාගරීකරණය ශීඝ්‍රතාව අතින් පළමු සහ දෙවන ස්ථාන ගන්නා කලාප දක්වා ඇති අක්ෂරය නිවැරදිව සඳහන් කරන්න.




1. පළමු ස්ථානය ගන්නා කලාපයේ අක්ෂරය

2. දෙවන ස්ථානය ගන්නා කලාපයේ අක්ෂරය (ලකුණු 02)

(ii) ඔබ ඉහත නම් කළ කලාප දෙක නම් කර ඒවායෙහි නාගරීකරණයේ කැපී පෙනෙන ලක්ෂණ වෙන වෙන ම සාකච්ඡා කරන්න. (ලකුණු 06)

(iii) සංවර්ධනය වෙමින් පවතින රටවල නාගරීකරණය හේතුකොටගෙන මතු වී ඇති ගැටලු තුනක් උදාහරණ සහිතව සාකච්ඡා කරන්න. (ලකුණු 06)

(iv) ශ්‍රී ලංකාවේ නාගරීකරණය ආශ්‍රිත සමාජ ආර්ථික ගැටලු විසඳීමට ගෙන ඇති ක්‍රියාමාර්ග තුනක් සාකච්ඡා කරන්න. (ලකුණු 06)

5206

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# தென் மாகாணக் கல்வித் திணைக்களம்
# Southern Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) 12 ශ්‍රේණිය තෙවන වාර පරීක්ෂණය, 2018 ජූලි
கல்விப் பொதுத் தராதர (உயர்தரப்) பரீட்சை 2018 ஜூலை, தரம் 12 மூன்றாம் தவணைப் பரீட்சை
**General Certificate of Education (Adv. Level), Grade 12 Third Term Test, 2018 July**

භූගෝල විද්‍යාව
**Geography I**

22 S I

## II කොටස

උපදෙස්:
- ප්‍රශ්න දෙකට ම පිළිතුරු සපයන්න.
- ප්‍රශ්න අංකය සහ අදාළ උප කොටස්වල අංක පිළිතුරු පත්‍රයේ පැහැදිලිව සඳහන් කළ යුතු වේ.

01. ශ්‍රී ලංකා මිනුම්දෝරු දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලද 1:50000 පරිමාණයේ මොරවක භූ ලක්ෂණ සිතියමෙන් කොටසක් ඔබට සපයා ඇත. එහි සමෝච්ඡ රේඛා අන්තරය මීටර් 20කි. මෙම සිතියම පදනම් කර ගනිමින් පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. සිතියම් ගත ප්‍රදේශයේ හඳුනාගත හැකි ජලවහන රටාව නම් කරන්න. (ලකුණු 02)
2. සිතියම් ගත ප්‍රදේශය සඳහා රේඛීය පරිමාණය ඇඳ දක්වන්න. (ලකුණු 02)
3. සිතියම්ගත ප්‍රදේශයේ උතුරු අර්ධයේ කැපී පෙනෙන භූ විෂමතා ලක්ෂණ දෙකක් කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 02)
4. සිතියම්ගත ප්‍රදේශයේ P ලෙස නම් කොට ඇති චතුරස්‍රය තුළ හඳුනාගත හැකි වගාවන් දෙකක් නම් කරන්න. (ලකුණු 02)
5. සිතියම්ගත ප්‍රදේශයේ A, B, C සහ D ලෙස නම්කර ඇති ලක්ෂණ නිවැරදිව හඳුනාගෙන නම් කරන්න. (ලකුණු 02)
6. සිතියම්ගත ප්‍රදේශයේ ජනාවාස රටා දෙකක් නම් කර ඒවා ව්‍යාප්ත වී ඇති ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 04)
7. සිතියම්ගත ප්‍රදේශයේ ආර්ථික කටයුතු සංවිධානය වී ඇති ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 04)

02.
1. නවීන සිතියම් විද්‍යාත්මක ක්‍රමවේදවල පොදු ලක්ෂණ දෙකක් නම් කරන්න. (ලකුණු 02)
2. පහත දක්වා ඇති භූගෝලීය තොරතුරු පද්ධතියක ඇතුළත් අංග කෙටියෙන් හඳුන්වන්න.
   1. පරිගණක 2. ආදාන උපාංග 3. මෘදුකාංග (ලකුණු 06)
3. ගෝලීය ස්ථානගත කිරීමේ තාක්ෂණය වඩාත් බහුල ලෙස භාවිතා කිරීමට හේතු වී ඇති කරුණු තුනක් සාකච්ඡා කරන්න. (ලකුණු 06)
4. භූගෝලීය තොරතුරු පද්ධතිවල හඳුනාගත හැකි සුවිශේෂී ගුණාංග තුනක් විස්තර කරන්න. (ලකුණු 06)